විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2010-03-30

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/ 2008 (සංශෝධන)**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>හමුදා සේවා හා දුබලතා විශ්‍රාම වැටුප් ඒකාබද්ධ කර ගෙවීම</u>**

ඉහත කරුණට අදාලව නිකුත් කරන ලද 2008- 10- 03 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/ 2008 අනුව හමුදා සේවා හා දුබලතා විශ්‍රාම වැටුප් ඒකාබද්ධ කර ගෙවීමේදී ගැටළුකාරි තත්වයක් පවතින බව මා වෙත වාර්තා වී ඇති බැවින් ඊට අනුපූරකයක් වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

2008- 01- 01 දිනට පෙර විශ්‍රාම ගිය විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් පරිවර්තනය කර ගෙවන ලෙස එම චක්‍රලේඛයේ මගින් උපදෙස් දී ඇත. එසේම 2008- 01- 01 දිනට පසුව විශ්‍රාම ගිය අයගේ විශ්‍රාම වැටුප් ද එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි පරිවර්තනය කර ගෙවිය යුතු බව දන්වා සිටිමි.

එසේම එම චක්‍රලේඛයේ "අ" උදාහරණය අනුව 1997- 01- 02 සිට 2004- 01- 01 දක්වා විශ්‍රාම ලැබූවන්ට 87, 88, 16/94, 5/99, 1/97 දීමනා ලබා දී සේවා විශ්‍රාම වැටුපට එකතු කර පරිවර්තනය ලබා දී වැටුප් ගෙවන ලෙස උපදෙස් ලබා දී ඇත. 2000- 01- 01 දින සිට 1/ 2000 විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ක්‍රියාත්මක වන හෙයින් මෙම වැටුප් පරිවර්තනයේදී 2000- 01- 01 සිට 2004- 01- 01 දක්වා විශ්‍රාම ලැබූවන්ට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/ 2000 මගින් ලබා දෙන රු. 400/= දීමනාවද ලබා දිය යුතු බව තවදුරටත් දන්වා සිටිමි.

කේ .ඒ .තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම්- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
02. ලේකම්- මුදල් අමාත්‍යාංශය
03. ත්‍රිවිධ හමුදාපතිවරුන්
04. ලේකම් - රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
05. විගණකාධිපති


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk